**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - 2022**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි 15 වන ඡේදයෙහි සඳහන් ප්‍රතිපාදන පරිදි අවසාන තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කළයුතු වුවද රු.මිලියන 155.83 ක් වූ අවසාන තොග ගණනය කිරීමේ උපලේඛණයක් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා එම තොග වටිනාකමේ නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය. තවද, කමිටුවක් මගින් පුහුණු මෙවලම්,අමතර කොටස් වෙන්කර හඳුනා ගැනීමට සහ ප්‍රයෝජනයට නොගන්නා ද්‍රව්‍ය,චලනය නොවන සහ සෙමෙන් චලනය වන ද්‍රව්‍ය බැහැර කරන ලෙසට 2012 අගෝස්තු 06 වැනි දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී උපදෙස් ලබා දී තිබුණද 2023 මැයි 10 දින වන විටත් අධිකාරිය ඒ අනුව ක්‍රියාකර නොතිබුණි. ඒ අනුව, | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය 2023 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට අපේක්ෂා කරන අතර එම ක්‍රියාවලිය අවසන් වූ විගසම තොග ශේෂයන් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කොට එයට අදාළ ගැළපුම් 2023.12.31 ගිණුම් මගින් සිදුකිරීමට බලාපොරොත්තුවේ. කෝප් රැස්වීමේ දී ලබාදී ඇති නිර්දේශ අනුව අමතර කොටස් සහ මෙවලම් වැනි පුහුණු ද්‍රව්‍ය ප්‍රධාන තොග වලින් වෙන් කර වාර්ෂිකව එම භාණ්ඩ නැවත තක්සේරු කිරීමට කමිටුවක් පත්කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල් තුමා වෙත දැනුම් දී ඇති අතර, කමිටුවක් පත්කල වහාම මෙම කාර්යය ඉටුකරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 පරිදි තොග වටිනාකම් ගණනය කළ යුතු අතර පැවති පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාවේදී ලබා දී තිබුණු උපදෙස් පරිදි ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් තොගයෙහි නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 07- දේපළ ,පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 65 වන ඡේදය පරිදි වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවම වශයෙන් සෑම වර්ෂයකට වතාවක් සමාලෝචනය කර අපේක්ෂිත තත්ත්වයන් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 - ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. එසේ වුවද 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු.මිලියන 683.7 ක්වූ දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එබඳු සමාලෝචනයක් කර නොතිබුණි.තවද පිරිවැය රු.මිලියන 101.83 ක් වූ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ, මෙවලම් සහ සන්නිවේදන උපකරණ ඇතුළු ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද අඛණ්ඩව භාවිතා කරමින් පැවතුනි. එම වත්කම්වල ඵලදායී ජීව කාලය හා සාධාරණ වටිනාකම රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 සහ 3 පරිදි ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් 2022 වර්ෂය තුලදි ප්‍රත්‍යාගණනය කිරිමට අදාල මූලික කටයුතු අධිකාරිය සිදු කර ඇත. ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය අවසානයේදී ප්‍රමිතියේ සඳහන් විධිවිධාන අනුගමනය කිරිමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තවදුරටත් ප්‍රමාදයකින් තොරව වාර්ෂිකව තක්සේරු කිරීමට ක්‍රියා කළ යුතු අතර පසුව අදාළ හෙළිදරව් කිරීම් සහ ගිණුම්කරණ කටයුතු සිදුකළ යුතුය. |

### 1.5.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බත්තරමුල්ල පිහිටි අධිකාරියට අයත් නිවාස සැලසුම් මධ්‍යස්ථානයේ පුහුණුව ලබන සිසුන්ගේ නේවාසික පහසුකම් සඳහා කාමර 08 කින් යුක්ත නේවාසිකාගාරයක් පැවතුණි. 2023 මාර්තු 20 දින මෙම නේවාසිකාගාරය සම්බන්ධයෙන් පවත්වන ලද භෞතික විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි එදින වන විට එයින් කාමර 05 ක් අධිකාරියේ කාර්යය මණ්ඩලය හා රේඛීය අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය සඳහා නිසි අනුමැතියක් තොරව හා ගාස්තු අයකිරීමකින් තොරව ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.<br>මේ අතර සේවකයින් මෙම කාමර තුළ කෑම පිසීම වැනි අනවසර කාර්යයන් සිදු කිරීම නිසා විදුලි හා ජල වියදම් වැඩිවී ඇති බවද කාමර අළුත්වැඩියා කිරීමට සිදුව ඇති බැවින් ඒ සඳහා අමතර වැයක් දැරීමට සිදුවන බව විගණනයේ දී නිරීක්ෂණය විය. තවද නේවාසික පහසුකම් නොතිබීම හේතුවෙන් පුහුණු පාඨමාලාවන් සඳහා දේශණ ශාලා පහසුකම් සැපයීමේ අවස්ථාවන් අහිමිවිය හැකි බවද බැහැර කල නොහැකි විය. | පුහුණු කටයුතු වලට බාධාවක් නොවන ආකාරයට කාමර කිහිපයක් අය කිරීමේ පදනමින් කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් සඳහා වෙන් කිරීමට කළමණාකරණය විසින් තීරණය කරන ලදී. | නේවාසිකාගාරය ඉදිකිරීමේ අරමුණ සඳහා උපයෝජනය කල යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 04 කට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබූ රු. මිලියන 4.72 ක ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර වසර 6-10 ත් අතර ණයගැති ප්‍රමාණයන් සම්බන්ධයෙන් ශේෂ සනාතන ලිපි, සිහිකැඳවීමේ ලිපි අවස්ථා 03 ක දී යොමු කර ඇත.<br>මෙම හිඟ ණය සඳහා අඩමාන ණය පසුගිය වර්ෂවලදි සම්පූර්ණයෙන් වෙන් කොට ඇති අතර බොහෝ ණයගැතියන් සම්බන්ධයෙන් මුලාශ්‍ර ලේඛන අධිකාරිය සතුව නොමැති බැවින් අදාල නීතිමය කටයුතු සිදු | මුලාශ්‍ර ලේඛණ සහිත ණය ශේෂයන් අයකරගැනිම සම්බන්ධයෙන් කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග කෙරෙහි යොමු විය යුතු අතර විධිමත් අනුමැතියක් සහිතව පමණක් කපාහැරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කිරිමද ගැටලුකාරී තත්වයක් බැවින් මුලාශ්‍ර ලේඛන නොමැති ණය කපා හැරීමට 2023.06.14 දින පැවති අභ්‍යන්තර විගණන කලමනාකරණ කමිටුවේ නිර්දේශ ලැබී තිබුණි. අනෙකුත් මුලාශ්‍ර ලේඛන පවතින හිඟ ණය අඩු කර ගැනිම පිණිස අධිකාරියේ නීති අංශය වෙත යොමු කොට ඇත. | |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් ගෙවිය යුතු ශේෂයන් තුල ඇතුළත් වසර 05 ත් 10 ත් අතර කාල පරාසයන් ගතව තිබූ එකතුව රු.මිලියන 4.70 ක ශේෂයක් පැවති නමුත් එම ශේෂ නිරවුල් කිරීමට හෝ ඒ පිළිබඳ සොයා බලා සුදුසු පියවරක් ගැනීමට මෙතෙක් අධිකාරිය ක්‍රියාකර නොතිබුණි. | විගණන හා කළමණාකරන කමිටු නිර්දේශ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී ක්‍රියාකෙරේ. | මේ පිළිබඳ සොයා බලා නිශ්චිතව ගෙවිය යුතු ශේෂයන් පියවීමටත් අනෙකුත් ශේෂයන් අධිකාරියේ ආදායමට හඳුනාගැනීමටත් ක්‍රියාකළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් පවත්වාගෙන යන පැලවත්ත, බත්තරමුල්ල පිහිටි ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් වන අතර අධිකාරිය විසින් ඒ තුළ ඉදිකරන ලද ගොඩනැගිලිවල පිරිවැය 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 306.15 ක් විය. මෙම ඉඩම සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුමකට එළඹීම සඳහා රු. මිලියන 54.9 ක් හා සියයට 07 ක ප්‍රමාද ගාස්තුවක් ලබාදෙන ලෙස 2019 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා තිබුණු නමුත් අධිකාරිය විසින් පොලිය සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීම සඳහා රේඛීය | මෙම රු.මිලියන 54.9 ක මුදල වෙනුවෙන් 2022 වර්ෂයේ ගිණුම් ප්‍රතිපාදනයක් සිදු නොකරන ලද්දේ මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ගිවිසුමක් එදිනට අප අධිකාරිය සතුව නොතිබීමයි. මේ සඳහා ඇති එකම ලිඛිත තහවුරුව වනුයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවන ලද ලිපිය පමණි. | මෙම ගැටළුව සම්බන්ධයෙන් අධිකාරියේ කඩිනම් අවධානය යොමු කළ යුතු අතර ඒ අනුව සුදුසු පරිදි අවසන් ගිණුම්වල අදාළ හෙළිදරව් කිරීම් සහ ගැලපීම් සිදුකළ යුතුය. |

අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීම් ලිපියක් යොමුකර තිබුණු අතර ගිවිසුකට එළඹීමට 2022 දෙසැම්බර් 31 දින තෙක් කටයුතු කර නොතිබුණි. එසේම 2019 වර්ෂයේ සිට ගෙවිය යුතු බදු මුදල් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 571 (2) | වර්ෂ 02 ක් ඉකුත් වූ ගෙවිය යුතු තැන්පතු නිරවුල් කිරීම හෝ අධිකාරියේ ආදායමට බැර කිරීම කළ යුතු වුවද එපරිදි කටයුතු නොකර 2000 සිට 2019 වර්ෂය දක්වා වූ කාලය තුළ රඳවා ගන්නා ලද මුදල් රු. මිලියන 2.20 ක් සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට භාජනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත වර්ෂ 02 ඉක්මවූ තැන්පත් ,ආදායමට හඳුනාගැනීමට ක්‍රියාකෙරේ. | වසර දෙකකට වඩා වැඩි තැන්පතු, මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ආදායමට බැර කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 756 | 2020 හා 2021 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල පෙන්වා දුන් ඌනතා සහ අතිරික්තයන් 2023 ජූනි 15 දින දක්වා නිවැරදි කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය හා තොග ශේෂ ගණනය කිරීම අවසන් වූ පසු මේ සම්බන්ධයෙන් ක්‍රියාකෙරේ. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වූ පසු වාර්තාවල සඳහන් ඌණතා හා අතිරික්ත හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 ජනවාරි 27 දිනැති අංක PED/01/2020 දරන මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 06 ඡේදය | එක් එක් සේවාව සඳහා ගත වන කාලයන් සහ ගාස්තු දක්වමින් පුරවැසි ප්‍රඥප්තියක් සකස්කර කාර්යාල පරිශ්‍රවල සහ වෙබ් අඩවිවල මහජනතාවට/පාරිභෝගිකයින්ට ප්‍රදර්ශනය කළ යුතුය. කෙසේ වුවද, අධිකාරිය විසින් 2023 ජූනි 15 දින වන විටත් මෙම චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පුරවැසි ප්‍රඥප්තිය 2023 වර්ෂයේ ජූලි මස ඇතුළත අදාළ පරිදි ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අධිකාරියේ මහජන වගවීම සහ පාලනය වැඩිදියුණු කිරීම සඳහා පුරවැසි ප්‍රඥප්තිය සකස් කර ප්‍රදර්ශනය කළ යුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 | නිළධාරීන් 06 දෙනකු විසින් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ඉන්ධන ලීටර් 12,789 ක් භාවිතාකර තිබුණි. ඒ අනුව වැඩිපුර වැයකරන ලද වටිනාකම වූ රු. මිලියන 1.6 ක මුදලක් මෙතෙක් ආපසු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂකවරුන් සඳහා අනුයුක්ත කර ඇති වාහනවල එම තනතුරට අනුමත සීමාවන් ඉක්මවා ඇත්තේ එම වාහන අනුයුක්ත කිරීම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 ට අනුකූලව සිදු නොවීම සහ ආයතනයේ හා අංශයේ අවශ්‍යතාවයන් සඳහා සහ ඇතැම් අවස්ථාවල සංචිත රාජකාරි සඳහාද එම වාහන යොදාගෙන තිබුණු නිසාය. තවද මේ වන විට අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාත්මක වන අතර වැඩියෙන් ලබා දී ඇති මුදල් අයකරගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛයේ සඳහන් ඉන්ධන සීමාවන් නොඉක්මවන පරිදි ඉන්ධන ලබා දීම කල යුතු බව හා වැඩිපුර භාවිතා කර ඇති ඉන්ධන වල වටිනාකම අයකර ගැනීමට කටයුතු කලයුතුයි. |
| (ඈ) | කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාගේ 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 10/2022 දරන හා 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය. | ධාවන තත්ත්වයේ නොතිබෙන හා අළුත්වැඩියා කොට භාවිතයට ගැනීම සුදුසු නොවන වාහන අපහරණය කළයුතු වුවද පිරිවැය රු.මිලියන 3.825 ක ජීප් රථයක් හා මෝටර් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන දෙක අපහරණය කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා කමිටුවක් පත් කර ඇත. මෙම වසරේදී එම කටයුතු අවසන් කිරීමට නියමිත වේ. | අධිකාරිය චක්‍රලේඛ ප්‍රකාරව භාවිතයට නුසුදුසු වාහන අපහරණය කිරීමට කටයුතු කළයුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ පවත්වාගෙන යන අංක 0077454975 දරන ජංගම ගිණුමෙහි සාමාන්‍ය වශයෙන් රු.මිලියන 307ක මුදල් ශේෂයක් පසුගිය වර්ෂ 05 කට අධික කාලයක් තුල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන තැන්පත්කර තිබුණි. මේ හේතුවෙන් සාමාන්‍ය පොළී අනුපාතිකය මත ගණනය කිරීමේදී අධිකාරියට ආසන්න වශයෙන් රු. මිලියන 149ක පොලී ආදායමක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය. | ඉතිරිව පවතින භාණ්ඩාගාර ප්‍රතිපාදන අදාල ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනිම උදෙසා කඩිනමින් උපයෝජනය කරලිමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවති. මෙම කෙටිකාලීන අතිරික්ත මුදල් කෙටි කාලීන ආයෝජනයට යෙදවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇති අතර අනෙකුත් අනුමැතීන් ලද විගස කෙටි කාලීන ආයෝජන මාර්ගයක යෙදවීමට කටයුතු කරනු ලැබේ. | අතිරික්ත මුදල් අදාළ අරමුණුගත කාර්යයන් සඳහා වහාම යෙදවිය යුතුය. අදාළ කටයුතු සඳහා යම් කාලයක් ගතවන්නේ නම් එම මුදල් නිසි අනුමැතීන්ට යටත්ව කෙටිකාලීන ආයෝජන සිදුකර ආදායමක් උපයාගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.43,145,508 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.38,129,480 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,274,988 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රටතුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්තය පසුබෑමකට ලක්ව තිබීම මත අධිකාරියේ ප්‍රධාන ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | 2022 (රු) | 2021 (රු) | වෙනස හිතකර/(අහිතකර) (රු) | වෙනස (%) |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| ලියාපදිංචි ආදායම් | 139,858,225 | 191,818,197 | (51,959,972) | (27.1) |
| පුහුණු පාඨමාලා ආදායම් | 25,162,899 | 13,431,917 | 11,730,982 | 87.3 |
| යන්ත්‍ර සූත්‍ර කුලී ආදායම් | 1,058,460 | 4,682,725 | (3,624,265) | (77.4) |
| විදෙස් කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචිය | 4,951 | 13,965,105 | (13,960,154) | (99.9) |
| ප්‍රකාශණ අලෙවිය | 3,738,821 | 5,705,653 | (1,966,832) | (34.5) |
| සම්මන්ත්‍රණ ගාස්තු | 5,729,100 | - | 5,729,100 | 100 |
| පොළී ආදායම් ස්ථිර තැන්පතු | 15,069,798 | 3,938,014 | 11,131,784 | 282.7 |
| ශ්‍රවනාගාරය සහ සම්මන්ත්‍රණ ශාලා කුළී ආදායම් | 6,483,941 | 1,741,792 | 4,742,149 | 272 |
| NVQ පුහුණු පාඨමාලා | 12,233,000 | 454,000 | (11,779,000) | 2,594 |

| | | | | |
|---|---|---|---|---|
| **වියදම්** | | | | |
| පැමිණීමේ දීමනා | 6,879,314 | 9,000,334 | 2,121,020 | 23.6 |
| මාසික දීමනා | 13,546,146 | - | (13,546,146) | 100 |
| වෙනත් දීමනා | 4,157,224 | 6,287,630 | 2,130,406 | 33.9 |
| ඉන්ධන දීමනා | 3,227,366 | 776,160 | (2,451,206) | (315.8) |
| බෝනස් ගෙවීම් | 5,770,144 | 3,106,332 | (2,663,812) | (86) |
| කාර්යාල උපකරණ නඩත්තු | 3,720,280 | 1,830,354 | (1,889,926) | (103.2) |
| වාහන නඩත්තු | 4,033,805 | 2,569,639 | (1,464,166) | (56.9) |
| යන්ත්‍ර උපකරණ නඩත්තු | 165,780 | 2,166,894 | 2,001,114 | 1207.1 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- රටතුළ පැවති අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් අධිකාරියේ ප්‍රධාන ආදායම් වූ කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි ආදායම් සියයට 27 කින් , යන්ත්‍ර සූත්‍ර කුළියට දීමේ ආදායම් සියයට 77 ක් හා ප්‍රකාශණ අලෙවි ආදායම් සියයට 35 ක් ද සමාලෝචිත වර්ෂය තුළදී අඩුවී තිබුණි.
- තවද පුහුණු පාඨමාලා ආදායම් සියයට 87 කින් හා පොළී ආදායම සියයට 282 කින් වැඩිවී තිබුණි.
- අධිකාරියේ මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් මාසික දීමනා ,ඉන්ධන දීමනා ,බෝනස් ගෙවීම් හා නඩත්තු වියදම් සැලකිය යුතු ලෙස වැඩිවීම වර්ෂයේ මූල්‍ය අලාභය වැඩිවීමට හේතුවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | වර්ෂය 2022 | 2021 |
|---|---|---|
| ජංගම අනුපාතය | 2.75: 1 | 2.37: 1 |
| ක්ෂණික අනුපාතය | 2.11: 1 | 1.92: 1 |
| වත්කම් මත ප්‍රතිලාභ (සියයට) | (3.17) | 2.47 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ ද කරනු ලැබේ.

- අධිකාරියේ සමාලෝචිත වර්ෂය තුළදී ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය වැඩි වී තිබුණි. රටතුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අධිකාරියේ ආදායම් අඩුවීම හා වියදම් වැඩිවීම මත ලාභ දායකත්වය අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ හිටපු සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවකට අනුව අධිකාරියේ අධ්‍යක්ෂ (මානව සම්පත්) නිලධාරියා 2022 සැප්තැම්බර් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනිවාර්යය නිවාඩු යවා තිබුණු අතර මේ සම්බන්ධ විනය | මූලික විමර්ශණ නිලධාරියා පත්කර ඇති අතර ඔහු විසින් මූලික විමර්ෂණ වාර්තාව හා චෝදනා පත්‍රය ලබා දීමෙන් පසු අදාල ගෙවීම් සිදු කරන ලදී. කෙසේවුවද මෙම කරුණ යටතේ සඳහන් කර ඇති ආකාරයට අදාල මූලික පරීක්ෂණ | මෙම අලාභය වගකිව යුතු පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට ක්‍රියාකල යුතුය. |

| | | |
|---|---|---|
| පරීක්ෂණ කටයුතු සඳහා 2023 ජනවාරි 20 දින වවුචර් අංක PC 123010090 මගින් රු. මිලියන 0.19 ක මුදලක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද 2018 ජූලි 31 දිනැති අංක 18/2018 දිනැති චක්‍රලේඛයෙන් බැහැරව මූලික විමර්ශණ නිලධාරියකු වෙත ගෙවා තිබුණි. මෙම විමර්ශන නිළධාරියාගේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් අධිකාරිය සතු වාහන මගින් කිලෝමීටර් 421 ක පමණ ප්‍රවාහන පහසුකම් ලබා දී තිබුණි. එසේ වුවද 2023 ජූනි 08 දිනැති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත චෝදනා ඔප්පු නොවීම මත චෝදනා පත්‍රය අවලංගු කර විනය කටයුතු අවසන් කිරීමට හා අනිවාර්යය නිවාඩු මත සිටි කාලය වෙනුවෙන් එම නිලධාරියාට අහිමි කරන ලද සියළු දීමනා හා ප්‍රතිලාභ ලබා දීමට තීරණය කර තිබුණි. මේ තුළින් අධිකාරියට රුපියල් ලක්ෂ 8 ක පමණ අලාභයක් සිදුව තිබුණු බවට විගණනයේ දී නිරීක්ෂණය විය. | වියදම රු.මිලියන 0.19 ගෙවීම් කිරීමට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොමැත. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ දී අධිකාරිය සතු අබලි වාහන 03 ක් රු. මිලියන 5.78 කට විකුණා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 03 ක් ලබා ගෙන තිබුණි. 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි විකුණුම් ප්‍රතිශ්‍යාව වූ රු. මිලියන 5.78 ක මුදල මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළයුතු වුවද අධිකාරිය විසින් මෙම මුදල 2023 ජූනි 30 දින වන විටත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම චක්‍රලේඛ ප්‍රකාරව රු. මිලියන 5.78 ක මුදලක් මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය අනුමැතින් ලද පසු ඉක්මනින් කටයුතු සිදු කරනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව විකුණුම් ප්‍රතිශ්‍යාව මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් සඳහා ශිල්පීය හැඳුනුම්පත් ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහාභාණ්ඩාගාරයෙන් රු. මිලියන 35.7 ක මුදලක් ලබා දී තිබුණි. එයින් රු.මිලියන 11.3 ක මුදලක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වසරේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය වෙත (ICTA) ලබා දී තිබුණු නමුත් අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය අතරමග නතර කිරීම නිසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය වෙත ගෙවන ලද මුදලින් රු.මිලියන 9.6 ක් ආපසු අයකරගෙන තිබුණි. ඉතිරි රු.මිලියන 1.7 ක් මෙම පද්ධතිය සංවර්ධනයට අදාළව විවිධ කාර්යයන් සඳහා වැය කල බවට විස්තර ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව එම මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. කෙසේ වුවද අධිකාරිය විසින් අවශ්‍යතාවය පරිදි තොරතුරු තාක්ෂණ පද්ධතියක් සංවර්ධනය කරගැනීමට උපදේශන සේවා ලබා ගැනීම සඳහා 2022 මාර්තු 11 දින ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත රු.මිලියන 3.35 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මෙම කටයුතු ආරම්භ කළ යුතු දිනය, නිම කළ යුතු කාලයන් දැක්වෙන සමස්ථ ව්‍යාපෘති යෝජනාව විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මෙම රු මිලියන 1.70 ක අත්තිකාරම් මුදල මේ වන විට පියවා ඇති අතර ඊට අදාල සනාථ ලේඛණ මේ සමග ඉදිරිපත් කරමි.<br>ශිල්පීය හැඳුනුම්පත් ලබා දිමේ වැඩසටහන සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමග එලඹි ගිවිසුම ඉදිරිපත් කර ඇත. | අපේක්ෂිත කාර්යය ඉටුකර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මනා අධීක්ෂණයකින් ඉටුකරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගල්කුලම මෙහෙයුම් ශිල්පී පුහුණු පාසලෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2020 සහ 2021 වර්ෂ වලදී එකතුව රුපියල් මිලියන 7.30 ක් අධිකාරිය වෙත ලබා දී තිබුණු නමුත් විගණිත දින වූ 2023 ජූනි 15 දින වන විටත් අරමුණුගත කාර්යය ඉටුකර නොතිබූ අතර එම මුදල් නිෂ්කාර්යයව පැවතුණි. | 2022 වසරේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 04/2022 අනුව බැඳීම් ඇති කර නොගත් මිලදී ගැනීම් හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොකල අතර අවශ්‍ය සැලසුම් හා ආරම්භ කල ක්‍රියාවලින් අවසන් කිරිම අඛණ්ඩව සිදු කරන ලදි. ඒ අනුව එම ඉතිරි රු මිලියන 7.3 ට අදාල සැලසුම්ගත ක්‍රියාවලින් කඩිනමින් අවසන් කිරිමට කටයුතු කරනු ලැබේ. | ලද අරමුදල් උපයෝගී කර කඩිනමින් අරමුණුගත කාර්යය ඉටු කිරීම සඳහා ක්‍රියාකළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස සැළසුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 400 කට ආසන්න ඉඩ ප්‍රමාණයක් 2022 වර්ෂය තුළ කුළියට දීම සඳහා හඳුනාගෙන තිබූ නමුත් කුලියට ලබා දී නොතිබුණු අතර නිශ්කාර්යව පැවතුණි. | ඉහල මහලේ ඇති වර්ග අඩි 400 කට ආසන්න ඉඩ ප්‍රමාණය ඉදිකිරීම්කරුවන්ගේ කුසලතා පරීක්ෂා කර ඔවුන්ට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින අතර ඒ සඳහා එම ඉඩ ප්‍රමාණය භාවිතයට ගැනීමට නියමිත වේ. | පවත්නා නිශ්කාර්යය සම්පත් භාවිතා කරමින් ආදායම් උත්පාදනය කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන මුදල් හා ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය පරිදි ප්‍රසම්පාදන කටයුතු සඳහා රාජ්‍ය ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියෙහි 2020 ජනවාරි 31 දිනට පෙර ලියාපදිංචි වන ලෙස දක්වා තිබුණද අධිකාරිය විසින් මේ දක්වා එම පද්ධතියෙහි ලියාපදිංචි වී නොතිබුණි. | මෙම වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි. | අදාළ චක්‍රලේඛය පරිදි මෙම පද්ධතිය මගින් ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. |

## 3.6 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් මෙහෙයුම් ශිල්පී පුහුණු පාසල පවත්වාගෙන යන ගල්කුලම පිහිටි රජයට අයත් ඉඩම අත්පත් කරගැනීමකින් තොරව රු.මිලියන 34.73 ක් වූ ගොඩනැගිලි ඉදිකර තිබුණි. තවද කතරගම පවත්වාගෙන යන සංචාරක බංගලාවේ ගොඩනැගිලි වටිනාකම හෝ ඉඩමේ අයිතිය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර හෝ හෙළිදරව් කර නොතිබුණි. | මෙහෙයුම් ශිල්පී පුහුණු විදුහල පිහිටි ඉඩම රජයේ ඉඩමක් වන අතර ඒ සඳහා දීර්ඝකාලින භුක්තිය ලබා ගැනීමට තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ පියවර ආරම්භ කොට ඇත. තවද කතරගම සංචාරක බංගලාව පිහිටි ඉඩම් සම්බන්ධව, දීර්ඝ කාලීන බදු පදනම මත, භුක්තිය ලබා ගැනිමට පියවර ආරම්භ කර ඇත. | මෙම දේපළ සම්බන්ධව නිශ්චිත බදු ගිවිසුම්වලට එළඹිය යුතුය. |
| (ආ) | අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම ටවර් හෝල් රඟහල පදනමට අයත් වූ අතර රු. මිලියන 6.00 ක බදුකුලියකට 30 අවුරුදු බදු ගිවිසුමකට 1986 වර්ෂයේදී එළඹ තිබුණි. එම බදු ගිවිසුම අවසන් වීමෙන් පසු 2016 වසරේ සිට නැවත අවුරුදු 30ක කාලයක් සඳහා ඉඩම භාවිතා කිරීමට 2019 වර්ෂයේ දී නව බදු ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද බදුකුලිය නැවත තක්සේරු කිරීමකින් තොරව 1986 වර්ෂයේ පැවති කුලී වටිනාකම වු රු. මිලියන 6.00 ඇතුළත් කර ගිවිසුමට එළඹීම,අතුරු බදු දීම් සිදුකළ හැකි බව දක්වා තිබීම යනාදී අවාසි සහගත කොන්දේසි ගිවිසුමට ඇතුලත් කිරීම නිසා ගිවිසුම සංශෝධනය හෝ අවලංගු කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා පවත්වා තිබුණි.<br>නැවත 2023 ජනවාරි 04 දින මේ සම්බන්ධව පවත්වා තිබූ අවසාන සාකච්ජාවේදී දෙපාර්ශවය විසින් වසර 30ක කාලයක් සඳහා දෙවන වරට එලඹී ගිවිසුම සංශෝධනය කිරීමට තීරනය කර තිබුණද | අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල, ටවර් හෝල් රඟහල පදනම සමග වසර 30 ක දීර්ඝ කාලීන බද්දක් මත භුක්ති විඳිනු ලැබේ. | දෙපාර්ශවය එකඟ වන පරිදි සාධාරන බදු ගිවිසුමකට එලඹිය යුතුය. |

රජයේ තක්සේරුකරු විසින් ලබා දී තිබූ රු.මිලියන 3.6 ක මාසික තක්සේරු බදු කුලී මුදල සම්බන්ධයෙන් අධිකාරිය එකඟ නොවීම නිසා නව ගිවිසුමකට එළඹ නොතිබුණි. මේ අනුව සාධාරණ කුලියක් ගෙවීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත ඇති අවදානම බැහැර කල නොහැකි විය.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 හා 2022 වර්ෂවල අධිකාරියේ මානව සම්පත් කළමනාකරණයේ කැපී පෙනෙන ගැටළුකාරී තත්ත්වයන් පැවතීම හේතුවෙන් නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීම්, අනිවාර්ය නිවාඩු යැවීම්, ඉල්ලා අස්වීම් , අධිකාරියට විරුද්ධව නඩු පැවරීම්, වන්දි ගෙවීම්,නීතිමය වියදම් වැඩිවීම ආදී අහිතකර කරුණු නිරීක්ෂණය විය. ඒ අනුව 2021 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2023 මැයි 25 දින දක්වා අධ්‍යක්ෂ ජනරාල් ධූරය අවස්ථාවන් 5 ක දී ද, අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර අවස්ථාවන් 5 කදී හා අධ්‍යක්ෂ ( මුදල්) තනතුර අවස්ථාවන් 4 ක දී ද ස්ථිර, වැඩ බැලීම්, රාජකාරි ඉටුකිරීම් හා රාජකාරී ආවරණ ආදී පදනම්වලින් පත් කිරීම කර තිබුණු අතර එම ධූර කාලයන් වරින්වර කෙටිකාල පරාසයන් තුල වෙනස් වී තිබුණි. ඒ සම්බන්ධ නිරීක්ෂණයන් කිහිපයක් පහත දැක්වේ.<br>හිටපු අධ්‍යක්ෂ ජනරාල් වරයකු විසින් තමාගේ සේවය අවසන් කිරීම නීත්‍යානුකූල නොවන බව දක්වමින් 2021 මාර්තු 05 දින කම්කරු උසාවියෙහි නඩු පවරා තිබුණු අතර මේ සඳහා අධිකාරිය විසින් රු. මිලියන 0.375 ක මුදලක් නෛතික වියදම් ලෙස දරා | 2022.04.26 දින දරන 03/2020 වැනි රාජ්‍ය වියදම් සීමා කිරීමේ චක්‍රලේඛ නිසා ආයතනයේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට ඇති නොහැකියාව මත ආයතනයේ අත්‍යාවශ්‍ය සේවා කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන ප්‍රධාන තනතුරුවල පැවති පුරප්පාඩු පිරවීම සඳහා මෙම පත්කිරීම් සිදුකර ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගැනීමෙන් පසු බඳවා ගැනීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. එම කම්කරු විනිශ්චයාධිකරණයේ තීන්දුව පරිදි අධිකාරිය විසින් රු. මිලියන 1.70 ක මුදලක් 2022 ජුනි 13 දින කම්කරු උසාවියේ තැන්පත් කර තිබුණි. එසේ වුවද අධිකාරිය විසින් අභියාචනාවක් මහාධිකරණයට ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව, කම්කරු විනිශ්චාධිකරණය විසින් දී ඇති තීරණය නිශේධනය කරමින් නඩු තීන්දුව ලැබී තිබුණු බැවින් හිටපු අධ්‍යක්ෂ ජනරාල් විසින් මහාධිකරණ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ගොනු කර තිබුණි. එබැවින් මීට අදාළ නිතිමය ක්‍රියාමාර්ග තවමත් අවසන් වී නොතිබුණි. | | |
| (ආ) | 2021 ඔක්තෝබර් 08 දින එවකට සිටි අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල් ) නිලධාරියාව අනිවාර්යය නිවාඩු යැවීමට එරෙහිව එම නිළධාරියා විසින් නෛතික ක්‍රියාමාර්ගවලට යොමුව තිබුණු අතර 2022 ජූලි 29 දින අභියාචනාධිකරණය විසින් ලබා දී තිබුණු නඩු තීන්දුව ප්‍රකාරව නිලධාරියාට නීත්‍යානුකූලව හිමි සියළු දීමනා හා පැවති සේවා කොන්දේසි තත්ත්වයන් යටතේ සේවා කාලයට හානියක් නොවන පරිදි නැවත සේවයේ පිහිටුවන ලෙස ඊට සම්බන්ධ පාර්ශවයන් 14 දෙනකු වෙත නියෝග කර තිබුණි. මේ හේතුව මත අධිකාරිය වෙත රු. මිලියන 2.60 ක පමණ අලාභයක් සිදුව තිබුණි. අධිකාරිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවින් තවදුරටත් මේ සම්බන්ධ නීති කටයුතු සිදු වෙමින් පවතින බවද නිරීක්ෂණය විය. | ආයතනයේ අත්‍යාවශ්‍ය සේවා කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන ප්‍රධාන තනතුරක් වන අධ්‍යක්ෂ මුදල් තනතුරේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා මෙම පත්කිරීම් සිදුකර ඇත. | අධිකාරිය විසින් මානව සම්පත නීත්‍යානුකූලභාවය රැකෙන පරිදි කළමණාකරණය කල යුතුය. |
| (ඇ) | 2021 පෙබරවාරි 15 දින සිට 2022 මාර්තු 31 දින දක්වා අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි අවුරුදු 1 ½ කාලයක් නිලධාරීන් දෙදෙනෙකු සභාපතිවරයා විසින් | ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ පරිපාලන නිලධාරියා වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර ආයතනික කටයුතුවලදී එම | අධිකාරිය විසින් මානව සම්පත නීත්‍යානුකූලව සහ නිසි පරිදි කළමණාකරණය |

| | | | |
|---|---|---|---|
| | වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. මෙම කාලසීමාව සඳහා රු. මිලියන 0.31 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි. තවද මෙම පත්කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තනතුරේ කටයුතු කිරීම සඳහා නිලධාරින් පත්කර ගැනීම අත්‍යාවශ්‍යව තිබූ හෙයින් එම තනතුරට වැඩ බැලීමේ පදනමින් මෙම නිළධාරීන් පත්කරගෙන ඇත. | කල යුතුය. |
| (ඈ) | වර්ෂ කිහිපයක් පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ මානව සම්පත් තනතුරු සම්බන්ධ බඳවාගැනීම් සඳහා රු. මිලියන 0.2 ක මුදලක් 2021 වර්ෂයේ දී වැයකර තිබුණද විවිධ හේතු මත ලැබුණු අයදුම්පත් ඇගයීමට ලක් නොකිරීම නිසා එම වියදම නිශ්කාර්ය වී තිබුණි. | මෙම පුවත්පත් දැන්වීමට අනුව අදාල පුරප්පාඩු පිරවීම සිදුවී නොමැති බව පිළිගනිමි. | අයදුම්පත් ඇගයීමට ලක් කර සුදුසු පුද්ගලයකු බඳවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | සහකාර අධ්‍යක්ෂ (ලියාපදිංචි හා අධීක්ෂක දේපල සංවර්ධන / අමුද්‍රව්‍ය සැපයුම්) තනතුර සඳහා විධිමත්ව නිලධාරිනියක් පත් කර සිටියදී තවත් නිලධාරියකු එම තනතුරටම රාජකාරි ඉටුකිරීමේ පදනම මත 2021 අගෝස්තු 13 දින සිට 2023 ජූලි 28 දින දක්වා පත්කර තිබූ අතර මේ අනුව නිලධාරීන් දෙදෙනෙකු එකම තනතුරෙහි කටයුතු කර තිබුණි. තවද රාජකාරි ඉටුකිරීම මත පත්කර තිබූ නිලධාරියා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක්ද ආරම්භ කර තිබුණු අතර ඒ අනුව රාජකාරි ඉටු කිරීමට පත් කිරීම ආයතන සංග්‍රහයට අනුව පටහැනි බව නිරීක්ෂණය විය. 2021 අගෝස්තු 13 දින සිට රු.8,862 බැගින් දීමනාවක් මෙම නිලධාරියාට ගෙවා තිබුණු අතර ඒ අනුව මෙසේ නිත්‍ය තනතුරක පුරප්පාඩුවක් නොමැතිව පත්කර රු. මිලියන 0.19 ක අධි ගෙවීමක් සිදු කර තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.<br>අධිකාරියේ බඳවාගැනීම් පටිපාටිය අනුව සහකාර අධ්‍යක්ෂ (ලියාපදිංචි හා අධීක්ෂක දේපල | මෙම පත්කිරීම නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | අනුමත කාර්යමණ්ඩලයට අනුකූලව බඳවාගැනීම් සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන/අමුද්‍රව්‍ය සැපයුම්) තනතුරට සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ සුදුසුකම් අවශ්‍ය කරන තනතුරක් වූ නමුත් ඒ සඳහා පුස්තකාල විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හා පළමු උපාධියක් දරන නිළධාරියකු එම කාර්යන් ඉටු කිරීමට පත් කිරීම මත භේදයට තුඩු දෙන ගැටලුවකි. තවද රාජකාරී ලැයිස්තුවට අනුකූල නොවූ වෙනත් රාජකාරී ලැයිස්තුවක් මෙම නිලධාරියාට ලබා දී තිබුණි. | | |
| (ඊ) | විගණනයට ඉදිරිපත්කළ තොරතුරු අනුව 2020 වසර සිට 2022 දක්වා හා 2023 අගෝස්තු 31 දක්වා වූ මාස 3 සඳහා දක්වා නීති වියදම් පිළිවෙළින් රු.මිලියන 0.074 , 0.10, 3.39 ක් සහ රු. මිලියන 5.56 වශයෙන් වැඩිවී තිබූ අතර මෙම වියදම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ අධිකාරියේ මානව සම්පත් පරිපාලන ගැටළු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ මුල රු.325,000 ක් ලෙස නීති ගාස්තු ඇස්තමේන්තු කරනු ලැබුවත් වර්ෂය තුල අලුතෙන් නඩු කිහිපයක්ම ආයතනයට එකතු වූ බැවින් නීති ගාස්තු වියදම් මෙපමණ ප්‍රමාණයකින් වැඩි විමට හේතු වි ඇත. මේ වෙනුවෙන් සංශෝධිත අයවැයක් අධ්‍යක්‍ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමත වී ඇත. | මනා මානව සම්පත් කළමණාකරණයක් තුළින් වියදම් කළමණාකරණය කෙරෙහි අවධානය යොමුකල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොත 6.6 පරිච්ඡේදය අනුව 2021 වර්ෂය සඳහා වූ අධිකාරියේ වාර්ෂික වාර්තාව මෙතෙක් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ජූලි මස දෙවන සතිය ඇතුලත අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම පිණිස රේඛීය අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය අනුව නියමිත දිනට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ කාර්යයන් දීප ව්‍යාප්තව කරගෙන යාම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාර්යාල 15 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල , පළාත් | දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාර්යාලයන් හි ලගාකර ගත යුතු ඉලක්කයන්, ලගා කර ගත යුතු කාලය සහ කාර්යය සාධන | ප්‍රාදේශීය කාර්යාලයන් හි ඉටු කළ යුතු කාර්යයන් හා සම්බන්ධ විස්තර ක්‍රියාකාරී |

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා හා ගොඩනැගිලි දෙපාර්තමේන්තු කාර්යාලයන්ට අනුබද්ධිතව ක්‍රියාත්මක කරනු ලබයි. එහෙත් 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැළැස්ම අනුව එම කාර්යාලයන් විසින් ඉටු කල යුතු කාර්යයන්, ලඟාකර ගත යුතු ඉලක්කයන්, කාල පරාසයන් සහ කාර්යයසාධන දර්ශකයන් නිශ්චිතව දක්වා නොතිබුණි. අධිකාරියේ සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රගති වාර්තාවක්ද විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණු බැවින් ප්‍රාදේශීය කාර්යාලයන්හි කාර්යයසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. | දර්ශකයන් ඉදිරි වර්ෂයේ සිට නිශ්චිතව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරිමට අවශ්‍ය පියවර ගනු ඇත. | සැළැස්මට ඇතුලත් කළයුතු අතර මාසික ප්‍රගතියද එම ක්‍රියාකාරී සැළැස්මට අනුකූලව දැක්විය යුතුය. |

**4.3 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි 4.3(iii) ඡේදය පරිදි තොග කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරිය විසින් දැනට භාවිතා කරනු ලබන පරිගණකගත ගිණුම්කරන පද්ධතිය තුල ගිණුම්කරන අවශ්‍යතාවයන් ඉටු කිරීමේදී සීමාසහිත කාර්යයභාරයන් ඉටුකිරිම තුල බොහෝ ගිණුම්කරණයේ අවශ්‍යතාවයන් ඉටු කිරිමට නොහැකි වී ඇත. එම කරුණු සැලකිල්ලට ගෙන නව පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක අවශ්‍යතාවය පිලිබඳ අවධානය යොමු කොට ඇති අතර නව පරිගණකගත ගිණුම්කරන පද්ධතියක් මගින් මෙම අවශ්‍යතාවය ද ඉටු කිරිම අපේක්ෂා කෙරේ. | චක්‍රලේඛය පරිදි විධිමත් තොග කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කළ යුතුයි. |